සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2013**

28559

## 8 - ශ්‍රේණිය

## ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය:- ..................................................................... කාලය: පැය 2යි.

උපදෙස් - I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
II කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා I කොටසට අමුණා බාර දෙන්න.

### I කොටස

* ප්‍රශ්න අංක 01 සිට 05 ප්‍රශ්නවලට නිවැරදි හා වඩාත් ගැළපෙන පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(1) තමාටත්, අන්‍යයන්ටත්, පරිසරයටත් යහපතක් කරන සිතුවිලි ,

1. ආවේගශීලී සිතුවිලිය. 2. සුභවාදී සිතුවිලිය.
3. නම්‍යශීලී සිතුවිලිය. 4. අසුභවාදී සිතුවිලිය.

(2) චිත්තවේගය සහ එහි ශාරීරික ප්‍රකාශන අතර ඉතාම ආසන්න සබඳතාවයක් පවතියි. ඒ අනුව බිය නමැති චිත්තවේගය අනුව හැසිරීමේ ප්‍රතිඵල වන්නේ,

1. හැඬීම, පහර දීම, කෑගැසීම, බැණීම
2. මුනිවත රැකීම, සතුටු කඳුළු සැලීම, කෑ ගැසීම, බැණීම
3. දෙපා වෙව්ලීම, ගොත ගැසීම, දහඩිය දැමීම, හැඬීම
4. පහර දීම, ඔල්වරසන් දීම, බැණීම , කෑ ගැසීම

(3) ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන රජය, පෞද්ගලික අංශය පළාත් පාලන ආයතන මගින් සපයන සේවාවන් හැඳින්වීමට සුදුසු වචනය,

1. පොදු අයිතිවාසිකම් යනුවෙනි. 2. මූලික අයිතීන් යනුවෙනි.
3. සමුපකාර සේවා යනුවෙනි. 4. පොදු සේවාවන් යනුවෙනි.

(4) "ගැටුමක් වනාහි යම් පුද්ගලයකු හෝ පුද්ගලයන් කණ්ඩායමක් තමන්ට ලබාගත යුතු යයි සිතන දෙයක් ලබාගැනීම සඳහා අනියත හෝ අන් සියලු දේ පරාජය කළයුතු යයි සිතීම නිසා ඇති වන තත්ත්වයන්" යනුවෙන් ගැටුම නිර්වචනය කළේ,

1. රොස් පීටස්බර්ග් 2. රොස් හැමිල්ටන්
3. රොස් පීටර් 4. රොස් ස්ටීන්ජර්

(5) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් නොවන පිළිතුර තෝරන්න.

1. දක්ෂ දරුවන්ට අධ්‍යාපනය ලබා දීම.
2. පුස්තකාල ක්‍රීඩා පහසුකම් සාධාරණව ලබාදීම.
3. සාකච්ඡා කර නිවැරදි තීරණ ගැනීම.
4. සමිති සමාගම්වල තනතුරු සාධාරණව ලබා දීම.

* අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(අනුගාමිකයන් , සමූපකාරය , ශ්‍රී ලංකාව, යුනිසෙෆ් , පුහුණු ශ්‍රමය)

(6) කායික හා මානසික ශ්‍රමය විශේෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා පුහුණු කිරීම මගින් ........................................... ලබාගත හැකිය.

(7) "එකා සැමටත් , සැම එකාටත්" යන සාමූහිකත්වය පෙන්නුම් කරන පාඨය ආදර්ශ කරගත් ආයතනය ...................................................යි.

(8) බහු සංස්කෘතියක් සහිත රටකට උදාහරණයකි. ..................................................................

(9) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හැඳින්වෙන තවත් නමකි. ..................................................

(10) නායකයා ආරම්භ කරන කාර්යයක් ඵලදායීව ඉටු කිරීමට ...........................................ගේ සහයෝගය අත්‍යවශ්‍ය වේ.

* 11 සිට 15 දක්වා ප්‍රකාශන නිවැරදි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(11) අනාරක්ෂිත ලෙස ගබඩා කර තැබීම නිසා රසායනික ද්‍රව්‍යවලින් අනතුරු සිදු විය හැක. (......)

(12) සාගර අභ්‍යන්තරයේ ඇති වන භූමිකම්පා හේතුවෙන් සුනාමි තත්ත්වයක් ඇති විය හැක. (......)

(13) සිතට දැනෙන ආවේග සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතුය. (......)

(14) වර්තමානයේ බොහෝ රැකියා අවස්ථා සඳහා අධ්‍යාපන සුදුසුකම් පමණක් ප්‍රමාණවත් වේ. (......)

(15) රිය අනතුරු ඇති වීමට පදිකයන්ගේ නොසැලකිලිමත්කම හේතු වේ. (......)

* අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සඳහා 'අ' කොටසේ ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුර 'ආ' කොටසින් තෝරා ඊට අදාළ අක්ෂරය වරහන තුළ ලියන්න.

| 'අ' | | 'ආ' |
|---|---|---|
| (16) දැඩි ආවේග සහිත බව නිසා | (.....) | a. රාමසාන් උත්සවය |
| (17) ගැටුම් නිරාකරණ කුසලතාවයකි | (.....) | b. එක් එක් ජනවර්ගයේ අනන්‍යතාවයක් ඇතිවීම |
| (18) ඉස්ලාම් ආගමික උත්සවයකි | (.....) | c. කාංසාව |
| (19) සංස්කෘතික විවිධත්වය නිසා සිදුවන්නකි | (.....) | d. වනාන්තර විනාශ නොකිරීම. |
| (20) ස්වාභාවික විපත් අවම කරගැනීමට ගත යුතු ක්‍රියාමාර්ගයකි. | (.....) | e. සහානුභූතික සවන්දීම |

( ලකුණු 2x20= ල. 40)

## II කොටස

- පළමු වැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(1) තුන් වන වාරයට අදාළව වැඩ ලෝකයට ඵලදායී ශ්‍රමිකයකු බිහි කිරීමට 'වැඩ ලෝකය පිළිබඳ ගවේෂණයක්' ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ කණ්ඩායමට ලැබුණේ වැඩ ලෝකයේ පවතින රැකියා ක්ෂේත්‍ර වගු ගත කිරීමටයි. ඔබ එහිදී සොයාගත් රැකියා වර්ග දෙකක් නම් කරන්න. (ල.2)

(ii) එම රැකියා ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු සොයාගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල.2)

(iii) වැඩ ලෝකයේ ඔබ කැමති රැකියාවක් සඳහා අවශ්‍ය සුදුසුකම් දෙකක් නම් කරන්න. (ල. 2)

(iv) එම රැකියාවට අවශ්‍ය ආචාර ධර්ම දෙකක් ලියන්න. (ල.2)

(v) රැකියාවක් තෝරා ගැනීමේ දී පළමුව තීරණය කළයුතු කරුණු දෙකක් ලියන්න. (ල.2)

(vi) මෙම ක්‍රියාකාරකම යෙදීමේ දී ඔබට පැන නැඟුණු ගැටලු දෙකක් ලියන්න. (ල.2)

(vii) එම ගැටලු විසඳා ගැනීමට ඔබ විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල.2)

(viii) රැකියාවක් සඳහා ඉල්ලුම් පත්‍රයක් සකස් කිරීමේ දී එහි ඇතුළත් විය යුතු දත්ත දෙකක් ලියන්න. (ල.2)

(2) (i) සුභදායී සිතුවිලිවලට උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(ii) සුභදායී සිතුවිලි අනුව ක්‍රියාත්මක වීමෙන් පුද්ගලයෙකුට ලැබෙන වාසි හතරක් ලියන්න. (ල. 4)

(iii) අයහපත් චිත්තවේග නිසා තමාට සිදු වූ අවාසි දෙකක් ලියා, ඉන් මිදීමට ගත හැකි ක්‍රියා මාර්ග තුනක් සඳහන් කරන්න. (ල. 5)

(3)

සඳ නාවත් කමක් නැතේ රත්තරං පුතේ
හිරු නාවත් කමක් නැතේ රත්තරං පුතේ
ඔනා දුකක් ඉහිලිය හැකි මහලු ජීවිතේ
ඒත් පුතේ නුඹ නාවොත් දුක වැඩියි හිතේ

(i) ඉහත ගීතය මඟින් අර්ථවත් වන්නේ කුමක් ද? (ල. 2)

(ii) ඔබ තුළ ඇති වන මානසික පීඩා මඟහරවා ගත හැකි ක්‍රම හතරක් ලියන්න. (ල. 4)

(iii) ගැටුම් ඇති වීමට බලපාන හේතු දෙකක් ලියා, නිරතුරුව ගැටුම් ඇති කරගැනීමෙන් සිදු වන අවාසි තුනක් සඳහන් කරන්න. (ල. 5)

(4) (i) සමාජය තුළ නායකත්වය දැකිය හැකි අවස්ථා දෙකක් ලියන්න. (ල.2)

(ii) නායකත්වය රඳා පැවැත්මටත්, එහි සාර්ථකත්වය සඳහාත්, තිබිය යුතු නායකත්ව ගුණාංග හතරක් සඳහන් කරන්න. (ල. 4)

(iii) ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය උගන්වන ගුරුතුමා ඔබ පන්තියේ ළමුන් කණ්ඩායම් කර මාතෘකා කිහිපයක් ලබා දුනි. ඔබ කණ්ඩායමට මල් වගා කිරීම සඳහා මල් පාත්තියක් සකස් කිරීමට ලැබුණි. එම කණ්ඩායමේ නායකයා ඔබ නම්, එම කාර්යය මනාව කිරීමට කණ්ඩායම මෙහෙයවන ආකාරය විස්තර කරන්න. (ල. 5)

(5) (i) ජන ජීවිතයේ යහපත පිණිස සපයන සේවාවන් පොදු සේවාවන් වේ. එවන් සේවාවන්ට උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(ii) පහත දැක්වෙන පොදු සේවාවන් ලබා දෙන ආයතනය පිළිවෙළින් ලියන්න. (ල. 4)

a. විදුලිය ..............................................................................

b. සෞඛ්‍යය ..............................................................................

c. ජල සම්පාදනය ..............................................................................

d. ප්‍රවාහනය ..............................................................................

(iii) පොදු සේවාවන් ප්‍රයෝජනයට ගන්නා පුරවැසියකු සතු යුතුකම් හා වගකීම් දෙකක් ලියා විස්තර කරන්න. (ල. 5)

(6) (i) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) ඔබගේ පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 4)

(iii) සමාජයක පුරවැසියෙකු ලෙස ඔබ සතු යුතුකම් හා අයිතිවාසිකම් ලැයිස්තුවක් පහත දැක්වේ. ඒවා යුතුකම් හා අයිතිවාසිකම් ලෙස වෙන් කර දක්වන්න. (ල.5)

පොදු දේපළ ආරක්ෂා කිරීම, පොදු දේපළ පරිහරණය කිරීම, දෙමාපිය රැකවරණය ලැබීම, දෙමාපියන්ට ගරු කිරීම, යහපත් සෞඛ්‍යය පුරුදු අනුගමනය කිරීම, අධ්‍යාපනය ලැබීමේ අයිතිය, විවේකය ගත කිරීමේ නිදහස, නිසි අධ්‍යාපනය ලැබීම, අන්‍යයන්ගේ නිදහසට බාධා නොකිරීම, කැමති රැකියාවක් කිරීම,

(7) (i) ස්වාභාවික විපත් දෙකකට උදාහරණ දෙන්න. (ල.2)

(ii) පහත පින්තූරවල දැක්වෙන මාර්ග සංඥාවලින් කියැවෙන දේ A, B, C, D අනුපිළිවෙළින් හඳුන්වන්න. (ල.4)



A



B



C



D

(iii) ස්වාභාවික විපත්වලින් සිදු වන හානි අවම කරගැනීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග පහක් සඳහන් කරන්න. (ල. 5)